- අචාර්ය. එම්.අයි එම්.කලිල් (2012), “Introduction to Physical Geography (in Tamil)”, නමින් පර්යේෂණ පොතක් ඉදිරිපත් කිරීම ISBN:978-955-0660-03-2

- එම් එච් එම් රිනෝස් හා අචාර්ය. එම්.අයි එම්.කලිල් (2012), “Geographic Information System”,. නමින් පර්යේෂණ පොතක් ඉදිරිපත් කිරීම ISBN:978-955-627-032-7

- අචාර්ය. එම්.අයි එම්.කලිල් අයි. එල්. එම්. සහිර් හා එම්. එල්. අබුල් අමීර්(2012), “Research Methodology” නමින් පර්යේෂණ පොතක් ඉදිරිපත් කිරීම ISBN:978-955-627-029-7

- එන්. සබ්රාජ් (2012), “அழிந்த தலமும் அழியாத அதன் தலபுராணமும்”, නමින් පර්යේෂණ පොතක් ඉදිරිපත් කිරීම

**පර්යේෂණ පත්‍රිකා:**

**ප්‍රකාශිත:**

- අචාර්ය ඒ. එම්. එම්. රමීස් . (2012), “எம்.ஏ. நு.்.மானின் நவீன காவியங்கள்”, නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- අචාර්ය ඒ. එම්. එම්. රමීස් . (2012), “தற்காலச் சூழலில் இலங்கை முஸ்லிம்களின் படைப்பிலக்கியம்” නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එස්. ආර්. යූ. සියාඩ් (2012), “பேராசிரியர் உவைஸ் அவர்களின் இஸ்லாமியத் தமிழ் இலக்கியத்தின் ஆய்வுத்திறன்”, නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- කේ. රඝුපරන්. . (2012), “பண்டிதர் க. வீரகத்தியின் இலக்கணத்துறைசார் பங்களிப்பு”, නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- අචාර්ය ඒ. එෂ් එම්. අෂ්රෆ්.(2012), “விரிவுரை மொழி: ஒரு திறந்த உரையாடல்” නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. ඒ. එස්. එෂ් සාධියා (2012), "Thamil Oviyan Kavithaihal – Oor Aayvu", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. ඒ. එස්. එෂ් සාධියා (2012), “Malayahak Kavithaihal Siththirikkum Malayahach Siruvarhal” නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

**ඉදිරිපත් කිරීම්:**

- අචාර්ය ඒ. එම්. එම්. රමීස් . "பாரதியின் பன்முக ஆளுமையும் புனைதிறனும்", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- අචාර්ය කේ. කනේසරාජා (2012), "தமிழர் அறிவாராய்ச்சியியல்", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

**කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය**

**පර්යේෂණ පත්‍රිකා:**

**ප්‍රකාශිත:**

- එම්. බි. එම්. ඉස්මයිල් හා ටී වෙල්නම්පි (2012), "A case study approach to Human Resource Planning -HRP- in Weaving Industry of Maruthamunai", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. බි. එම්. ඉස්මයිල් (2012), "Corporate Social Responsibility (CSR) in People's Bank (PB) of Sri Lanka (SL)", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. බි. එම්. ඉස්මයිල් "Cultural Groupings of Villages in Ampara District, Eastern Province of Sri Lanka: An application of Hofstedian Cultural Dimensions" නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. බි. එම්. ඉස්මයිල්(2012), "Sri Lankan Tourism (SLT): A Forecast of Foreign Tourists (FFT)", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- ඒ. එම්. ඉන්නුන් ජාරියා (2012), "Western Cultural Values & its implication on Management Practice", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- හංසියා රවුෂ් මිය (2012), "Allocentrism and organizational citizenship behaviour in the context of Sri Lankan Universities", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එස්. ගුනපාලන් . (2012), "Entrepreneur's Perception towards Information Technology Change: An Empirical study in small businesses in Ampara District", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එස්. ගුනපාලන් . (2012), "Effectiveness of Self-employment Schemes in the Ampara District of Sri Lanka", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එස්. ගුනපාලන් . (2012), "Impact of Entrepreneurs' Personal Attitudes on Entrepreneurial Success with Social Reference to Badulla District", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එස්. ගුනපාලන් . (2012), "Economic Aspects of Micro Entrepreneurs in Ampara District of Sri Lanka Micro Finance Perspectives", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- සරීනා යූ.එම්. ඒ.ගෆූර්. (2012), "Leadership Style of Principals and Job Satisfaction of Teachers: an empirical study of perception of teachers with special reference to Sammanthurai Zonal Education Division", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- සරීනා යූ.එම්. ඒ.ගෆූර්. (2012), එම් සී එම් රිස්වි (2012), "The impact of Motivation System on Job Satisfaction: Case of Prima Ceylon Limited Group of Company" නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- සල්මියා යූ ඒ ජලීල්. (2012), "The Role of Personality of Women Entrepreneurs' in Coping with Information Technology Change: නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- සල්මියා යූ ඒ ජලීල්. (2012), "Personal Factors and Entrepreneurial Success: a Study of Women Headed Families in Ampara District", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- සල්මියා යූ ඒ ජලීල්. (2012), "Factors Influencing on Entrepreneurial Success: An Empirical Examination among Women Headed Families in Ampara and Batticalooa district", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- ඒ එල් එම්. ඒ සමීම් (2012), "Displacement, Resettlement, and Development- Interrelation and Contradictions: A Case from Ampara District of Sri Lanka", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- ඒ එල් එම්. ඒ සමීම් (2012), "Barcode Enabled Inventory Management System for Successful Pharmaceutical Business Organization at International Research Conference", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- ඒ එල් එම්. ඒ සමීම් (2012), "The Role of Entrepreneurs in Conflict Transformation: A case study in South Eastern Sri Lanka", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. බී. එම්. ඉස්මයිල් "Contribution of Entrepreneurship towards social development: A special focus on Micro and Small Entrepreneurs", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. බී. එම්. ඉස්මයිල් හා එස්. ගුනපාලන් . (2012), "Corporate culture among Sri Lankan state sector employees: A special focus on Divisional Secretariats in Ampara District of Sri Lanka", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. බී. එම්. ඉස්මයිල් (2012), "Demographic Profile of Micro, Small and Medium Entrepreneurs in South Eastern Region -SER- of Sri Lanka", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. බී. එම්. ඉස්මයිල් (2012), "Entrepreneurial Challenge in Ampara Coastal Belt of Sri Lanka", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. බී. එම්. ඉස්මයිල් (2012), "Application of Attribute Quality Control Chart (AQCC): A Case Study of Brick Manufactory of Neinaakkadu and its Peripherals of Ampara Coastal Belt (ACB) in Sri Lanka", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. බී. එම්. ඉස්මයිල් හා ටී. වෙල්නම්පි (2012), "Evaluation of Corporate Performance (CP) in Public Health Service Organisations (PHSO) in Eastern Province of Sri Lanka using Balanced Score Card (BSC)" නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. බී. එම්. ඉස්මයිල් (2012), "Identification of Micro, Small and Medium Entrepreneurial Marketers- MSMEMs- in South Eastern Region -SER-: A qualitative analysis", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. බී. එම්. ඉස්මයිල් (2012), "Service Quality (SQ) and Bank Client Satisfaction (BCS) in South Eastern Region (SER) of Sri Lanka", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. බී. එම්. ඉස්මයිල් (2012), "Service Quality (SQ) and Bank Client Satisfaction (BCS) in South Eastern Region (SER) of Sri Lanka" නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- එම්. බී. එම්. ඉස්මයිල් (2012), "Village Cultural Values (VCV): A Focus of Ampara Coastal District (ACD) in Sri Lanka" නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- ඒ.එම්. එම්.මුස්තාෆා (2012), "Effects of Direct Capitalizing by the Foreign Countries in the export of Sri Lanka", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- ඒ.එම්. එම්.මුස්තාෆා (2012), "The Role of Tourism in Regional Development : A Study of Batticaloa District", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- ඒ.එම්. එම්.මුස්තාෆා (2012), "A Case study approach to tourism Industry in Arugambay Area – Eastern Part", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- සඤනා එම්. පී. හසාන් (2012), "Conflict Management Strategies of Teachers in Eastern Province in Sri Lanka", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- ඒ. එම්. ඉන්නුන් ජාරියා (2012), "Future Research needs in Developing Sri Lanka; concepts trends Vision", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

- ඒ. එම්. ඉන්නුන් ජාරියා (2012), "Corporate Environmental Pro-activity and Business Performance – An empirical Analysis in Sri Lanka", නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම

## 9. වැඩසටහන්,සම්මන්ත්‍රණ,වැඩමුළු පිලිබඳ විස්තර:

| විෂයය | සහභාගි වීම | සම්පූර්ණ කිරීම | ඉදිරිපත් කිරීම |
|---|---|---|---|
| අ. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව | 23 | 07 | 04 |
| ආ.පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | 01 | 01 | 01 |
| ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව | - | - | - |
| ඈ ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | - | - | - |
| ඉ.සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව | 16 | 03 | - |
| ඊ.වෙනත් | 05 | 03 | - |
| එකතුව | **45** | **11** | **8** |

## 10. ප්‍රදානයන් පිළිබඳ විස්තර:

| විෂයය | ප්‍රදාන සංඛ්‍යාව | අධ්‍යනිකයන් සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. දේශිය ප්‍රදානයන් | - | - | - |
| ආ. ජාතික ප්‍රදානයන් | 02 | - | - |
| ඇ. ජත්‍යායන්තර ප්‍රදානයන් | 02 | 01 | - |
| ඈ.වෙනත් | 01 | 01 | - |
| එකතුව | 05 | 02 | - |

## 11. ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර

| පීඨය | පාඨමාලා | මාධ්‍යය | සහතිකපත් | ඩිප්ලෝමා | පශ්චාත් ඩිප්ලෝමා | ශාස්ත්‍රප ති | දර්ශන පති | දර්ශනශූ රි |
|---|---|---|---|---|---|---|---|---|
| අදාල නොවේ | | | | | | | | |

## 12. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර:

| විෂයය | 2011 (රුපියල්) | 2012 (රුපියල්) |
|---|---|---|
| අ. පුද්ගලික වැටුප් | 207447319.00 | 224,662635.99 |
| ආ. ගමන් | 1988772.00 | 205,4329.01 |
| ඇ. සැපයුම් | 20806987.00 | 190,75399.19 |
| ඈ. නඩත්තු | 23306967.00 | 28381887.75 |
| ඉ. ගිවිසුම්ගත සේවා | 48851790.00 | 57,443247.55 |
| ඊ. වෙනත් | 10482994.00 | 22107226.44 |
| එකතුව | **312884829.00** | **353,724725.73** |

## 13. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර:

| විෂයය | 2010 (රුපියල්) | 2011 (රුපියල්) |
|---|---|---|
| අ. කාර්යාල උපකරණ,ලි බඩු අත්පත් කර ගැනිම | 15096000.00 | 33,523450.10 |
| ආ. යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනිම | 5464000.00 | - |

| | | |
|---|---|---|
| ඇ. ගොඩනැගිලි අත්පත් කර ගැනීම | 14490000.00 | 18766316.71 |
| ඈ.වෙනත් (පොත්) | 3550000.00 | 137535187.79 |
| ඉ. සන්නිවේදන | - | 5778152.83 |
| එකතුව | **38600000.00** | **195603107.43** |

## 14. ව්‍යාපෘති පිළිබඳ විස්තර: (දේශීය අරමුදල්)

| නම සහ විස්තර | ණය / ප්‍රදාන | ප්‍රදානීය ආයතනය | මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මිලියන | ප්‍රතිපූරණය කළහැකි විදේශාධාර (රු.මිලියන) | දේශීය අරමුදල් (රු.මිලියන) |
|---|---|---|---|---|---|
| කලා සහ සංස්කෘතික පීඨය ගොඩනැගිලි සංකීර්ණය | | | 137.00 | - | - |
| කළමණාකරන හා වාණිජ පීඨය ගොඩනැගිලි සංකීර්ණය | | | 160.00 | - | - |
| පුස්ථකාලය | | | 200.00 | - | - |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | | | 170.00 | - | - |
| ව්‍යවහාරික විද්‍යා පීඨය- නිල නිවාස | | | 149.00 | - | - |
| එකතුව | | | **816.00** | - | - |

## ව්‍යාපෘති පිළිබඳ විස්තර: (විදේශීය අරමුදල්)

| නම සහ විස්තර | ණය / ප්‍රදාන | ප්‍රදානීය ආයතනය | මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මිලියන | ප්‍රතිපූරණය කළහැකි විදේශාධාර (රු.මිලියන) | දේශීය අරමුදල් (රු.මිලියන |
|---|---|---|---|---|---|
| ගැහැණු සහ පිරිමි නේවාසිකාගාර- ගොඩනැගිලි සංකීර්ණය | ණය | අරාබි ආර්ථික සංවර්ධනය සදහා වූ කුවෙට් අරමුදල | 315.00 | 283.50 | 31.50 |
| කාර්ය මණ්ඩල නිල නිවාස -ගොඩනැගිලි සංකීර්ණය | | | 160.00 | 144.00 | 16.00 |
| ශිෂ්‍ය මධ්‍යස්ථානය- ගොඩනැගිලි සංකීර්ණය | | | 60.00 | 54.00 | 6.00 |
| ඉස්ලාමීය අධ්‍යාපනය සහ අරාබි භාෂා පීඨය - ගොඩනැගිලි සංකීර්ණය | | | 140.00 | 126.00 | 14.00 |
| ක්‍රීඩා ලීය සහ ක්‍රීඩා ගාරය | | | 55.00 | 49.50 | 5.50 |
| තාක්ෂණ පීඨය - ගොඩනැගිලි සංකීර්ණය | | | 130.00 | 117.00 | 13.00 |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය- ගොඩනැගිලි සංකීර්ණය | | | 24.00 | 21.60 | 2.40 |
| එකතුව | | | **884.00** | **795.60** | **88.40** |

## 15. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර: (දේශීය අරමුදල්- මිලියන)

| නම | මුලු පිරිවැය ඇස්තමේන්තුව (රුපියල්) :මිලියන- | 2011 වර්ෂයේ වැය (රුපියල්) :මිලියන- | 2012 වර්ෂයේ වැය (රුපියල්) :මිලියන- | 31/12/2012 දිනට සමුච්චිත පිරිවැය (රුපියල්) :මිලියන- | භෞතික කාර්යසාධන ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| කලා සහ සංස්කෘතික පීඨය ගොඩනැගිලි සංකීර්ණය | 137.00 | 2.28 | - | 131.66 | 100 |
| කළමණාකරන හා වාණිජ පීඨය ගොඩනැගිලි සංකීර්ණය | 160.00 | 36.48 | 28.92 | 106.09 | 90 |
| පුස්ථකාලය | 200.00 | 50.02 | 22.25 | 1234.03 | 70 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 170.00 | 10.96 | 46.54 | 63.45 | 60 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය- නිල නිවාස | 149.00 | 21.53 | 26.57 | 46.76 | |
| එකතුව | **816.00** | **121.27** | **124.28** | **471.00** | |

## ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තරය (විදේශීය අරමුදල් - මිලියන)

| නම | මුලු පිරිවැය ඇස්තමේන්තුව (රුපියල්) (මිලියන) | 2011 වර්ෂයේ වැය (රුපියල්) (මිලියන) | 2012 වර්ෂයේ වැය (රුපියල්) (මිලියන) | 31/12/2012 දිනට සමුච්චිත පිරිවැය (රුපියල්) | භෞතික කාර්යසාධන ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| ගැහැණු සහ පිරිමි නේවාසිකාගාර- ගොඩනැගිලි සංකීර්ණය | 315.00 | - | - | 315,300,478.48 | 100 |
| කාර්ය මණ්ඩල නිල නිවාස - ගොඩනැගිලි සංකීර්ණය | 160.00 | - | - | 148,871,450.83 | 100 |
| ශිෂ්‍ය මධ්‍යස්ථානය- ගොඩනැගිලි සංකීර්ණය | 60.00 | - | - | 53,442,166.07 | 100 |
| ඉස්ලාමීය අධ්‍යාපනය සහ අරාබි භාෂා පීඨය - ගොඩනැගිලි සංකීර්ණය | 140.00 | - | - | 138,886,135.25 | 100 |
| ක්‍රීඩා පිටිය සහ ක්‍රීඩා ගාරය | 55.00 | - | - | 48,005,659.91 | 100 |
| තාක්ෂණ පීඨය - ගොඩනැගිලි සංකීර්ණය | 130.00 | - | - | 106,598,063.31 | 100 |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය- ගොඩනැගිලි සංකීර්ණය | 24.00 | - | - | 22,257,693.56 | 100 |
| එකතුව | 884.00 | - | - | 833,361,647.41 | |

## 16. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ විස්තරය (වැය)

| විෂයය | 2012 වර්ෂයේ ප්‍රතිපාදන (රුපියල්) | 2012 වර්ෂයේ වැය (රුපියල්) | ඉතිරිය රු/ අතිරික්තය (රුපියල්) |
|---|---|---|---|
| අ. පුනරාවර්තන - ව්‍යාපෘති හැර | 315,100,000.00 | 353,724,725.73 | 2,501,488.81 |
| ආ. ප්‍රාග්ධන - ව්‍යාපෘති හැර | 196,000,000.00 | 195,603,107.43 | 396,892,57 |
| ඇ. ව්‍යාපෘති - දේශීයව මූල්‍යනය කරන ලද | - | - | - |
| ඈ. ව්‍යාපෘති - විදේශීයව මූල්‍යනය කරන ලද | - | - | - |
| **එකතුව** | **547,100,000.00** | **549,327,833.16** | **2,898,381.38** |

## 17. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ විස්තරය (ඉපයූ ආදායම)

| විෂයය | 2012 වර්ෂයේ ප්‍රතිපාදන (රුපියල්) | 2012 වර්ෂයේ රැස්කිරීම් (රුපියල්) | ඌනතාවය/ අතිරික්තය (රුපියල්) |
|---|---|---|---|
| අ. උපාධි අධ්‍යාපනය | 275,000.00 | 151,070.00 | 123,930.00 |
| ආ. පශ්චාත් උපාධි අධ්‍යාපනය | - | - | - |
| ඇ. උපදේශන | 110,000.00 | 107,650.00 | 2350.00 |
| ඈ. වෙනත් | 7,715,000.00 | 13,484,370.67 | 5,769,370.67 |
| **එකතුව** | **8,100,000.00** | **13,743,090.00** | **5,895,650.67** |

## 18. මූල්‍ය කාර්ය සාධනය විශ්ලේෂණය - 2012

| විෂයය | ශ්‍රිතය | ඒක ශිෂ්‍ය වැය (රුපියල්) |
|---|---|---|
| අ. ඒක ශිෂ්‍ය පුනරාවර්තන (වැය) | පුනරාවර්තන වැය / සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව | 173,906.00 |
| ආ. ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන (වැය) | ප්‍රාග්ධන වැය/ සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව | 96,167.00 |
| එකතුව | | 270,073.00 |

## 19. යටිතල ව්‍යුහමය පහසුකම් ලැබීම් පිළිබඳ විස්තරය - 2012

| යටිතල ව්‍යුහමය පහසුකම් විස්තරය | වැය (රුපියල්) | භෞතික කාර්යසාධනය |
|---|---|---|
| කළමනාකරණ සහ වාණිජ විද්‍යා පීඨය | | කෙරිගෙන යන |
| පුස්තකාලය | | |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | | |
| වැඩ බෙදා වෙන් කිරීම සහ වායුසමීකරණ සවිකිරීම | | සම්පූර්ණ කරන ලද |
| සංස්කෘතික කෞතුකාගාරය පිහිටුවීම | | |
| වට තාප්පයක් (පැරපෙට් වෝල්) | | |

## 20. විගණකාධිපති වාර්තාව

ඊඑන්/ඒඒම්/ඒ/එස්ඊයූඑස්එල්/එෆ්එස්/2012 2013 නොවැම්බර් 12 දින

උප කුලපති,

ශ්‍රී ලංකා අග්නි දිග විශ්වවිද්‍යාලය.

**ශ්‍රී ලංකා අග්නි දිග විශ්වවිද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා අග්නි දිග විශ්වවිද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති හා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) හා (7) උප වගන්ති සමහ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

- **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

  ---

  මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළයෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල

අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

## 2.1 තත්ත්වාගණනය කළ විගණන මතය

--------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අග්නි දිග විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

--------------------------------------

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-----------------------

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.1,498,750,862 ක් වූ දේපල , පිරියත හා උපකරණ වටිනාකම පොත් අගය මත පදනම් වී තිබුණි. මෙම වත්කම් පිළිබඳ භෞතික පරීක්ෂණයක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමේ ක්‍රමය ඇතුළත්ව රජයේ ප්‍රදාන සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය විශ්වවිද්‍යාලය විසින් හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල රු.763,843 ක් වූ පහත දැක්වෙන වගකීම් හෙළිදරව් කර නොතිබුණි.

| විස්තරය | මුදල |
|---|---|
| --------- | ----- |
| | රු. |
| වේතන හා ප්‍රවාහන | 112,910 |
| පුවත්පත් වියදම | 47,990 |
| දුරකථන ඇමතුම් ගාස්තු | 603,943 |
| | ------------- |
| | 763,843 |

(ආ) රු.219,364,484 ක මුදලක් ස්ථාවර වත්කම් මුදලට මිලදී ගැනුම් ලෙස හා රු.220,300,000 ක් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සඳහන් කර තිබුණද, රු.24,300,000 ක් වටිනා පරිත්‍යාග වාහනද ඉහත සඳහන් මුදලේ ඇතුළත් කර තිබුණි.

(ඇ) රු.64,345,984 ක් වූ ක්ෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.60,466,003 ක් ලෙස දක්වා තිබුණි. එබැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.3,879,981 කින් ක්ෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සම්මන්ත්‍රණය (Symposium ) සඳහා දරන ලද පුනරාවර්තන ස්වරූපයේ රු.2,499,730 ක් වූ වියදම මූලධන වියදමක් ලෙස සාවද්‍යව වර්ගීකරණය කර තිබුණි.

(ඉ) රු.8,000,000 ක් වූ ස්ථාවර තැන්පතු ආපසු ගැනීම්, වෙනත් ආදායමට බැරකර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.8,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති (MBA) වැඩසටහන හා බාහිර උපාධි හා වෘත්තීය ඉගැන්වීම් සඳහා මධ්‍යස්ථානය (CEDPL) විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මක වන ඒකකයන් වේ. 2012 වර්ෂයේදී මෙම ඒකකයන් විසින් පහත සඳහන් අතිරික්ත මුදල් උපයා ගෙනතිබුණි.

| | පාඨමාලා ගාස්තු | වියදම | අතිරික්තය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති (MBA) වැඩසටහන | 7,435,810 | 4,779,437 | 2,656,373 |
| බාහිර උපාධි හා වෘත්තීය ඉගැන්වීම් සඳහා මධ්‍යස්ථානය (CEDPL) | 3,434,145 | 4,714,654 | (1,280,509) |
| | 10,869,955 | 9,494,091 | 1,375,864 |

විශ්ව විද්‍යාලය විසින් 2012 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ඉහත පාඨමාලා ගාස්තු හා වියදම දක්වා නොතිබුණි.

### 2.2.3 ලැබිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**ආපදා ණය**

නිලධාරීන් 03 දෙනෙකුට ලබාදෙන ලද ආපදා ණය වලින් හිඟ හිටි රු.293,123 ක් දීර්ඝ කාලයක සිට අයකර නොතිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය විස්තරය | ගිණුම්වල දැක්වෙන වටිනාකම | විගණනයට ඉදිරිපත් නොකළ ලිඛිත සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ගොඩනැගිලි | 440,304,744 | තක්සේරු වාර්තාව |
| ලී බඩු | 89,549,319 | වටිනාකම දැක්වෙන සත්‍යාපන වාර්තා |
| පොත් සහ වාර සඟරා | 105,022,133 | සත්‍යාපන වාර්තා සහ උපලේඛන |
| උපකරණ | 301,314,501 | සත්‍යාපන වාර්තා |
| ආරක්ෂක තැන්පතු | 2,111,418 | සනාථ කිරීම් |
| දර්ශනවේදී / ශාස්ත්‍රපති උපාධිය | 3,278,422 | විස්තරාත්මක උපලේඛන |
| වාහන අළුත්වැඩියා | 2,309,124 | අදාළ ලියකියවිලි හෝ ලිපිගොනු |

### 2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ)** <u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය</u> | |
| (i) X පරිච්ඡේදයේ 23 වගන්තිය | කථිකාචාර්යවරුන්ට ලබාදෙන ලද නිවාඩු සම්බන්ධයෙන් නිවාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (ii) X පරිච්ඡේදයේ 20.6 වගන්තිය | වැටුප් රහිතව ලබාගන්නා සියළුම නිවාඩු පොදු 96 ආකෘතියෙන් විගණකාධිපතිවරයාට වාර්තා කර නොතිබුණි. |
| | (iii) XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පැමිණීම හා පිටවීම සටහන් කිරීමට පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>XIX පරිච්ඡේදයේ 05 වගන්තිය | රජයේ නිල නිවාසවල පදංචිවී සිටීම වෙනුවෙන් නිලධාරීන්ගේ වැටුප්වලින් කුලියක් අයකළ යුතු වුවද, එසේ පදිංචිව සිටි නිලධාරීන්ගේ වැටුප්වලින් කුලී අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) | <u>මුදල් රෙගුලාසි</u> | |
| | (i) 1647 (ආ) | විශ්වවිද්‍යාලය ආරම්භයේ සිටම එහි වාහන සම්බන්ධයෙන් සමීක්ෂණ සිදුකර නොතිබුණි. |
| | (ii) 702 (3) | කොන්ත්‍රාත් ගිවිසුම්වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයට අනුයුක්ත වාහන 20 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ඉ) | 1998 මාර්තු 10 දිනැති අංක පීඑ/1/174/11(ආ) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබාගැනීමෙන් තොරව භාෂා දීමනාව රු.310,906 ක් නිලධාරීන්ට ගෙවා තිබුණි. |
| (ඊ) | 2005 ජනවාරි 31 දිනැති අංක 856 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 6.3 හා 6.4 ඡේදය | මහපොළ හා ශිෂ්‍යාධාර ගෙවීම්වලට අදාළව විශ්වවිද්‍යාලය විසින් කමිටුවක් පත්කර මාසික කාර්ය සාධන වාර්තා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යැවිය යුතු බවට උපදෙස්දී තිබුණි. කෙසේ වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලොචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.442,113,071 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.398,504,487 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු.367,417,850 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.74,695,221 දක්වා අඩුවී තිබුණු අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු.341,832,350 ක රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එම වර්ෂයේ ඌනතාවය රු.56,672,137 ක් විය. ඒ අනුව රු.18,023,084 කින් මූල්‍ය ප්‍රතිඵලයේ තවදුරටත් පිරිහීමක් දැක්වුණි.

## 3.2 විශ්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### (අ) ආදායම හා වියදම

| විස්තරය | 2012 | 2011 | වැඩිවීම / (අඩුවීම) | වැඩිවීම / (අඩුවීම) ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.(000) | රු.(000) | රු.(000) | % |
| ආදායම | 13,743 | 9,172 | 4,571 | 50 |
| වියදම | 455,856 | 407,676 | (48,180) | (12) |
| ඌනතාවය | 442,113 | 398,504 | (43,609) | (11) |
| රජයේ ප්‍රදාන | 367,418 | 341,832 | 25,586 | 07 |
| රජයේ ප්‍රදානවලින් පසු අතිරික්තය / ඌනතාවය | 74,695 | 56,672 | (18,023) | (32) |

(ආ) මූල්‍ය තත්ත්වය

----------------

| විස්තරය | 2012 | 2011 | වැඩිවීම / (අඩුවීම) | වැඩිවීම / (අඩුවීම) ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.(000) | රු.(000) | රු.(000) | % |
| වෙනත් මූල්‍ය වත්කම් | 9,473 | 22,314 | (12,841) | 58 |
| වෙනත් ජංගම වත්කම් | 62,191 | 85,723 | (23,532) | (27) |
| මුදල් හා මුදල් සමාන ශේෂ | 3,330 | 390 | 2,940 | 754 |
| පර්යේෂණ ප්‍රදාන පදනම්ව අත්තිකාරම් ගෙවීම | 292 | 292 | - | 0 |
| බදු ණය හිමියෝ | - | - | - | - |
| ප්‍රාග්ධන ප්‍රදාන (වැය නොකළ) | 936 | - | 936 | - |
| වෙනත් අරමුදල් | 3,284 | 2,628 | 656 | 25 |

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 4.1 කාර්ය සාධනය

----------------

සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යයන් කිහිපයක විස්තර පහත දැක්වේ.

| පවත්වන ලද උපාධි පාඨමාලාව | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | | සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 2012 | 2011 | 2012 | 2011 |
| ව්‍යවහාර විද්‍යාව | නැත | 184 | 43 | 15 |

| | | | | |
|---|---|---|---|---|
| කලා හා සංස්කෘතික | නැත | 118 | 179 | 02 |
| කළමනාකරණ හා වානිජ්‍යය | නැත | 274 | 106 | 01 |
| ඉස්ලාම් හා අරාබි | නැත | 243 | 88 | 04 |
| | ------ | ----- | ----- | ------ |
| එකතුව | - | 819 | 416 | 22 |

(අ) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී උපාධි ලබාගත් මුළු සංඛ්‍යාව සියයට 1790 කින් ඉහළ ගොස් තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ස්ථිර කථිකාචාර්යවරුන් සංඛ්‍යාව 105 ක් වූ අතර එක් කථිකාචාර්යවරයකුට සිසුන් සංඛ්‍යාව 19 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී සිසුන් 776 දෙනෙකුට රු.13,531,550 ක් වූ මහපොළ ශිෂ්‍යත්ව, ගෙවා තිබූ අතර සිසුන් 1,096 කට රු.16,286,300 ක් වූ ශිෂ්‍යාධාර ගෙවා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී පිරිමි සිසුන් 505 කට හා කාන්තා සිසුන් 918 කට නේවාසිකගාර පහසුකම් ලබාදී තිබුණු අතර දරන ලද මුළු නේවාසිකාගාර වියදම රු.4,028,152 ක් විය.

(ඉ) ක්ෂය නොමැතිව මුළු මෙහෙයුම් වියදම රු.391,510,177 ක් වූ අතර මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2034 ක් විය. සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.192,483 ක් වූ අතර පසුගිය වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.196,150 ක් විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉංගිසි අංශයේ කථිකාචාර්යවරයකුට එක්සත් රාජධානියේ නෝත්‍රම්බ්‍රියා ( Northunbria ) විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි අධ්‍යයනය සඳහා 2006 සැප්තැම්බර් 15 සිට 2010 ජනවාරි 10 දක්වා අධ්‍යයන නිවාඩු ලබාදී තිබුණි. ඔහුගේ අධ්‍යයන නිවාඩු සම්පූර්ණ කිරීමෙන් පසුව, වර්ෂ තුනක් ගතවීමෙන් පසුවත් සහතිකය ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් කථිකාචාර්යවරයා විසින් බැඳුම්කරය හා ගිවිසුම් කඩ කර ඇති බවට විගණනයේදී සැලකීමට සිදුවේ. බැඳුම්කර වටිනාකම රු.8,942,758 ක් විය.

(ආ) ඉන්දියාවේ මැඩ්‍රාස් (Madras ) විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි අධ්‍යයනය සඳහා II ශ්‍රේණියේ තවත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකුට 2008 ජූලි 26 සිට 2009 ජූලි 25 දක්වා වර්ෂ 1 ක කාලයක් සඳහා අධ්‍යයන නිවාඩු ලබාදී තිබුණි. එහෙත් කථිකාචාර්යවරයා විසින් ඔහුගේ අධ්‍යයනය අත්හැර දමා තිබුණි. බැඳුම්කරය හා ගිවිසුම උල්ලංඝනය කිරීම හේතුවෙන් රු.1,035,321 ක් වූ සම්පූර්ණ බැඳුම්කරයම ආපසු ගෙවීමට 2011 දෙසැම්බර් 13 දින පවත්වන ලද 49 වැනි නිවාඩු සහ ප්‍රදාන කමිටුව (Leave and Award Committee ) විසින් තීරණය කර තිබුණි. කෙසේ වුවද මෙම මුදල අයකර ගැනීමට 2013 පෙබරවාරි 22 විගණන දිනය දක්වාම ඵලදායී පියවර ගෙන නොතිබුණි.

### 4.3 ව්‍යාපෘති ප්‍රමාදය

------------------

විශ්වවිද්‍යාලයෙ ප්‍රධාන සැලැස්ම පිළියෙල කිරීම සඳහා 2006 වර්ෂය තුළ උපදේශක සේවා ලෙස රු.16,866,550 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද එම ප්‍රධාන සැලැස්ම 2013 අප්‍රේල් 30 වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 4.4 අත්තිකාරම් නිරවුල් කිරීම

---------------------------

(අ) විශේෂිත කාරණයන් සඳහා අත්තිකාරම් ලෙස රු.88,975 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද අරමුණු කළ කාර්යයන්ට යොදා ගැනීමෙන් තොරව දීර්ඝ ප්‍රමාදයකින් පසු මෙම අත්තිකාරම් සම්පූර්ණයෙන් මුදලින් නිරවුල් කර තිබුණි.

(ආ) රු.878,100 ක් වූ අත්තිකාරම් හතරක්, ලබාගත් කාර්යය නිම කිරීමෙන් පසු සැලකිය යුතු ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

### 4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

(අ) උපකුලපතිවරයාගේ පෞද්ගලික නිවසේ තීන්ත ආලේප කිරීමේ වැඩ සඳහා රු.118,460 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද මෙම ගෙවීම විධිමත් අනුමැතියකින් තොරව සිදුකර තිබුණි.

(ආ) උපකුලපතිවරයාගේ පෞද්ගලික නිවසේ 2012 වර්ෂයේ විදුලි බිල්පත් හා ජල බිල්පත් ලෙස රු.218,481 ක මුදලක් විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

## 4.6 භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම

---------------------------------------

### (අ) ප්‍රසම්පාදන ක්‍රමය

--------------------

ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ (TEC) කමිටු සටහන් වාර්තා කිරීමට ලේඛනයක් පවත්වා නොතිබුණි. ඒ වෙනුවට ගොනු ගත නොකළ පත්‍රිකා ආකාරයෙන් අදාළ ප්‍රසම්පාදන ලිපිගොනුවල තබා තිබුණි. එය පසුව ලියකියවිලි හා තොරතුරු වෙනස් කිරීමට හෙතුවිය හැක. මෙහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ (ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛ අංක 08 ) 2.11.3 වගන්තියේ විධිවිධාන විධිමත්ව අනුගමනය කර නොතිබුණි.

### (ආ) වානේ මේස හා පුටු මිලදී ගැනීම

----------------------------------

2012 පෙබරවාරි 28 දින වානේ මේස හා පුටු මිලදී ගැනීම සඳහා රු.1,257,120 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ★ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා 1998 ඔක්තෝබර් 20 දිනැති අංක 365 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව විවෘත ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර නොතිබුණි.
- ★ අතින් භාරදුන් මිල ගණන් 04 ක් පමණක් ලබාගෙන තිබුණි.
- ★ භාර ගැනීම් ලේඛනයේ ලියකියවිලි ලැබීම් පිළිබඳ සටහන් කර නොතිබුණි.
- ★ ඇගයීම් වාර්තාව හා ඇගයීම් කමිටුව සඳහා පත්වීම් ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
- ★ පුවත්පත්වල හා දැන්වීම් පුවරුවේ ටෙන්ඩර් දැන්වීම් ප්‍රසිද්ධ කළ යුතුය. කෙසේ වුවද මෙම ටෙන්ඩරය අවශ්‍ය පරිදි එසේ ප්‍රසිද්ධ කර නොතිබුණි.
- ★ ටෙන්ඩර් මණ්ඩල සටහන් අනුව, සාමාජිකයන් 03 දෙනෙකු ටෙන්ඩර් මණ්ඩලයට සහභාගී වී තිබුණි. කෙසේ වුවද විශ්වවිද්‍යාලයට අනුයුක්ත එක් සාමාජිකයකු එදින විශ්වවිද්‍යාල රාජකාරියේ යෙදී සිට නොමැත.
- ★ එකතු කළ අගය මත බදු විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**4.8** **පර්යේෂණ ප්‍රදාන**

-------------------

**(අ)** **පර්යේෂණ දීමනා ලබාගැනීමේ පරිපාටිය**

--------------------------------------------

- කාර්ය මණ්ඩලයේ 86 ක් පර්යේෂණ දීමනා ලබාගෙන තිබුණද, නිලධාරීන් 11 ක් පමණක් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර තිබුණි.

- කිසිඳු යෝජනාවක් නොමැතිව කාර්ය මණ්ඩලයට පර්යේෂණ දීමනා ගෙවා තිබුණි.

- 2011 හා 2012 වර්ෂ තුළ එක් පරියේෂණ කමිටු රැස්වීමක් පවත්වා තිබුණි.
  මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ කළමනාකරණය විසින් පර්යේෂණ දීමනා ලබාගන්නා අධ්‍යයන කාර්ය මණ්ඩලය මඟින් පර්යේෂණ කාර්යයන් කඩිනම් කිරීමට කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

**(ආ)** **නිරවුල් නොකළ පර්යේෂණ ප්‍රදාන**

-----------------------------------

පර්යේෂණ වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් 13 දෙනෙකුට රු.291,869 ක් වූ පර්යේෂණ ප්‍රදාන ගෙවා තිබුණි. කෙසේ වුවද මෙම පර්යේෂණ ප්‍රදාන දීර්ඝ කාලයක් නිරවුල් කර නොතිබුණි.

**4.9** **ගෙවීම්**

---------

**(අ)** **ගරු දීමනා (Honorarium ) ගෙවීම - රු.1,111,036**

-------------------------------------------------------

2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නි දිග විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා බාහිර පාඨමාලා අංශය විසින් රු.1,111,036 ක් වූ ගරු දීමනා ගෙවීම් 2012 ජනවාරි සිට දෙසැම්බර් කාලපරිච්ඡේදය සඳහා බාහිර උපාධි හා බාහිර පාඨමාලා ගිණුමෙන් නිලධාරීන් 25 දෙනෙකුට ගෙවා තිබුණි. කෙසේ වුවද ගරු දීමනා ගෙවීම සඳහා චක්‍රලේඛ, රීති හා රෙගුලාසිවල කිසිඳු විධිවිධානයක් නොවීය.

**(ආ) කුලී ගාස්තු ගෙවීම - රු.98,800**

----------------------------------

2012 පෙබරවාරි 15 සිට මාර්තු 12 දක්වා බාහිර උපාධි විභාග කටයුතු සඳහා කුලියට ගත් වාහනයක් වෙනුවෙන් රු.98,800 ක් කුලී ගාස්තු ගෙවා තිබුණි. කෙසේ වුවද විශ්වවිද්‍යාලයට ඇතුළුවෙන ස්ථානයේ ආරක්ෂක කාර්යාලය පවත්වා තිබුණු වාර්තා වලට අනුව ඉහත සඳහන් කුලී වාහනය එකී කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාලයට ඇතුළුවූ බවට සටහන් කර නොතිබුණි.

**(ඇ) අයකර නොගත් විදුලි ගාස්තු**

------------------------------

නිල නිවාස 22 ක විදුලි ගාස්තු රු.446,571 ක් විශ්වවිද්‍යාල අරමුදල් වලින් ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවා තිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය ප්‍රකාරව අදාල පදිංචිකරුවන්ගෙන් විදුලි ගාස්තු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 4.10 පුස්තකාල පරිපාලනය

-----------------------

අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සීමාවක් නොමැතිව පොත් ලබාගෙන තිබුණු අතර, එම පොත් වර්ෂ 7 කට ආසන්න කාලයක් පුස්තකාලයට ආපසු භාරදී නොතිබුණි. සීමාවක් නොමැතිව පොත් ලබාගැනීම හා නියමිත වේලාවට එම පොත් පුස්තකාලයට ආපසු භාරදීම් සිදුනොවීම හේතුවෙන් වෙනත් සිසුන්ට හා නිලධාරීන්ට පොත් භාවිතා කිරීමේ අවස්ථා මඟහැරී තිබුණි.

## 4.11 අධ්‍යක්ෂ හා සම්බන්ධීකාරකවරුන් පත්කිරීම

-----------------------------------------------

2010 ඔක්තෝබර් 25 දිනැති අංක 935 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව, පාලක සභාව විසින් අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවා, පාලක සභාව විසින් පත්කරන ලද මණ්ඩලයක් මඟින් බාහිර උපාධි හා බාහිර පාඨමාලා ඒකකයට අධ්‍යක්ෂක හා සම්බන්ධිකාරකවරුන් පත් කළ යුතුය. කෙසේ වුවද පාලක සභාව විසින් ඉහත රීති හා රෙගුලාසි වලට පටහැනිව අධ්‍යක්ෂ හා සම්බන්ධීකාරකවරුන් පත් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

---------------------------------------

**5.1 සංයුක්ත සැලැස්ම**

-------------------

2012- 2016 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද, පාලක සභාව විසින් එය අනුමත කර නොතිබුණි. තවද ඉකුත් වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක්ද සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

--------------------

2012 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එබැවින් ඉලක්ක ඉටුකර නොගැනීම, අතිරික්ත වියදම හා සංයුක්ත සැලැස්ම අනුව කාර්ය සාධනය, සම්පූර්ණ කර නොගැනීම සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කළ නොහැකි විය.

**5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

------------------------

අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

**5.5 වාර්ෂික වාර්තාව සභාගත කිරීම**

----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6 පරිච්ඡේදයේ 6.5.3 ඡේදය ප්‍රකාරව 2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5.6 අභ්‍යන්තර විගණනය**

-----------------------

**(අ)** අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය

-----------------------------------------

- අදාල ක්ෂේත්‍රයේ ප්‍රවීණ නිලධාරින් ප්‍රමාණවත් ප්‍රමාණයක් යෙදවීම අත්‍යවශ්‍ය වේ. 2009 ජනි 09 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන මහපෙන්වීම්වල 03 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයේ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටිය යුතු වුවද, මෙම ඒකකය සඳහා එක් නිලධාරියකු එනම් සහකාර අභ්‍යන්තර විගණක පමණක් යොදවා තිබුණි.

- මුදල් පනතේ විධිවිධාන අනුව, අර්ධ වාර්ෂික විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් විශ්වවිද්‍යාලය විසින් මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි.

**6.** පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) අත්තිකාරම් ගෙවීම හා නිරවුල් කිරීම

(ඈ) පුස්තකාල පරිපාලනය

(ඉ) සේවක ණය

(ඊ) වෙනත් ගෙවීම්

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති

**21. විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු**

එස්ඊයූ/වීසී/බී/ඒජී/2012

ඔබේ අංකය : ඊඑන්/ඒඑම්/ඒ/එස්ඊයූඑස්එල්/එෆ්එස්/2012

2014 මාර්තු 05 වන දින.

**<u>ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (2) (2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

2013 නොවැම්බර් 12 වන දින නිකුත්කරන ලද ඔබගේ ඉහත වාර්තාව සඳහා අපගේ නිරීක්‍ෂණ පහත සඳහන් වේ.

**2.0 මූල්‍ය ප්‍රකාශනය.**

**2.1 තත්වාගණය කරන ලද මතය**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.**

**2.2.1 <u>ගිණුම් ප්‍රතිපත්ති</u>**

(අ) නිවැරදි කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතියි. වත්කම් පිළිබඳ භෞතික පරීක්‍ෂණයක් සිදු කරමින් පවතියි.

(ආ) සටහන් කර ගතිමි. නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

(අ) සටහන් කර ගතිමි. නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) සටහන් කර ගතිමි. නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ක්‍ෂය පිළිබඳ සැසඳුම් ප්‍රකාශය විගණන දෙපාර්තමේන්තුව වෙත භාර දී විස්තර කරන ලදි.

(ඈ) ජාත්‍යයන්තර සම්මන්ත්‍රණ සඳහා මූලධන ප්‍රතිපාදන යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා භාණ්ඩාගාරය විසින් අරමුදල් වෙන් කර තිබූ බැවින්, මූලධන වියදමක් ලෙස මෙම වියදම සටහන් කරන ලදි.

(උ) භාහිර උපාධි පාඨමාලා විසින් උපයා ගත් අරමුදල් විශ්ව විද්‍යාලය වෙත බැර කර ඇත. කෙසේ නමුත් මෙම වර්ෂයට අදාල මූල්‍ය වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කටයුතු කරනු ලැබේ.

(ඌ) නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

### 2.2.3 ලැබිය යුතු ගිණුම්.

(අ) ආපදා ණය

මොවුන් දැනට සේවයේ නොමැති අතර හිඟ ණය මුදල මොවුන්ගේ අර්ථසාදක අරමුදලින් අයකර ගැනීමට කැමැත්ත පලකර ඇති අතර ඒ අනුව ක්‍රියා කරනු ලැබේ.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | 440,304,744 | ගොඩනැගිලි, ලී බඩු, පොත් සහ උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. මෙම වත්කම් පිළිබඳ භෞතික පරීක්ෂණයක් සිදු කරමින් පවතියි. |
| ලී බඩු | 89,549,319 | |
| පොත් සහ වාරසඟරා | 105,022,133 | |
| උපකරණ | 301,314,501 | |
| ආරක්ෂක තැන්පතු | 2,111,418 | සනාථකර ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති අතර තවමත් ප්‍රතිචාරයක් ලැබී නැත. |
| දර්ශනවේදී/ශාස්ත්‍රපති උපාධි පිළිබඳ විස්තරාත්මක සැලැස්ම | 3,278,422 | සියලුම තොරතුරු මූල්‍ය/ අංශයේ දැනට පවතින අතර විගණනය සඳහා කටයුතු කරනු ලැබේ. |
| වාහන අළුත්වැඩියා | 2,309.124 | සියලුම අදාල ලිපිගොනු සහ ලියකියවිලි පරිපාලන අංශයේ දැනට පවතින අතර විගණනය සඳහා කටයුතු කරනු ලැබේ. |

**2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

**(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය**

(1) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිවාඩු පිළිබඳ සටහන් හා විස්තර අධ්‍යනාංශ ප්‍රධානීන් විසින් දෙපාර්තමේන්තු මට්ටමින් පවත්වාගෙන යනු ලබයි.

(2) සටහන් කර ගතිමි. නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(3) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීමේ ලේඛන අධ්‍යනාංශ ප්‍රධානීන් විසින් පවත්වාගෙන යනු ලබයි.

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ ආයතන සංග්‍රහයේ 19වන පරිච්ඡේදයේ 5 වන වගන්තිය**

(1) කුලිය අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**(ඇ) මූල්‍ය රෙගුලාසි**

| | |
|---|---|
| (1) 1647 (බී) | නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (2) 702 (3) | අත්සන් සහිත ගිවිසුම්වල පිටපත් විගණකාධිපති ජෙනරාල් වෙත යැවීමට කටයුතු සිදු කරනු ලැබේ. |
| (3) 569 | තැන්පත් ගිණුම් පිළිබඳ විස්තර පවත්වාගෙන යන අතර විගණකාධිපති වෙත පිටපතක් ලබා දී ඇත. මෙය විගණනය සඳහා කටයුතු කරනු ලැබේ. |

**(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය**

| | |
|---|---|
| (1) 41/90 චක්‍රලේඛය | සියලුම වාහන සඳහා ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදු කරමින් පවතියි. |

**(ඉ) 1998 මාර්තු 10 දිනැති අංක පීඊ/1/174/11(ආ) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය.**

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 08/2013 දරන ලිපිය ප්‍රකාරව සියලුම සේවකයින් සඳහා 2013 මැයි මස සිට මෙම භාෂා දීමනාව ලබා දෙන ලදි.

**(ඊ) 2005 ජනවාරි 31 දිනැති අංක 856 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 6.3 හා 6.4 ඡේදය.**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දුන් මෙම උපදෙස් සම්පූර්ණයෙන් ම අනුගමනය කර ඇත.

## 3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සටහන් කර ගතිමි.

3.2 විග්‍රාත්මක මූල්‍ය සමාලෝචනය

**(අ) ආදායම හා වියදම**

සටහන් කර ගතිමි.

**(ආ) මූල්‍ය තත්ත්වය**

සටහන් කර ගතිමි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

**4.1 කාර්ය සාධනය**

(අ) සටහන් කර ගතිමි.

(ආ) සටහන් කර ගතිමි.

(ඇ) සටහන් කර ගතිමි.

(ඈ) සටහන් කර ගතිමි.

(ඉ) සටහන් කර ගතිමි.

**4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා**

(අ) එම්. ඒ. එම්. සමීම් මහතා - කථිකාචාර්ය (ඉංග්‍රීසී අංශය)

2013 ජුනි මස 28 වන දින පවත්වන ලද 57 වැනි නිවාඩු හා ප්‍රදාන කමිටුව විසින් උක්ත සඳහන් කථිකාචාර්යවරයාගේ සහතික ඉදිරිපත් කිරීම සඳහා මාස 03ක කාලයක් ලබා දෙන ලදි.

(ආ) ෆවුසුල් අමීර් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරයේ තීරණය අනුව, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ෆවුසුල් අමීර් මහතාගේ ආචාර්ය උපාධි අධ්‍යයනය සඳහා ඉන්දියාවේ මැඩ්‍රාස් විශ්වවිද්‍යාලයට ගෙවා ඇති පාඨමාලා ගාස්තුව නැවත අයකර ගැනීමට එම විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරීවරයාගෙන් ඉල්ලීමක් කර ඇත. එසේම ඔහු විසින් ලබා ගත් වසරක අධ්‍යයන නිවාඩුව, ඔහුට හිමිවන අධ්‍යයන නිවාඩු වලින් ආවරණය කර ගැනීමට විශ්වවිද්‍යාල පාලන අධිකාරය තීරණය කර ඇත.

**4.3 ව්‍යාපෘති ප්‍රමාදය**

අග්නිදිග විශ්ව විද්‍යාලයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා උපදේශකයෙකු ලෙස “ARUP” යොදවා ගැනීමට ක්‍රියාකරනු ලැබුවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම ප්‍රධාන සැලැස්ම විදිමත්ව සකස් කිරීම “ARUP” වෙත පවරන ලදී. ප්‍රාථමික ප්‍රධාන සැලැස්ම විශ්ව විද්‍යාලයට බාර දී ඇත. ප්‍රාථමික ප්‍රධාන සැලැස්ම සමාලෝචනය කිරීමට හා යාවත්කාලීන කිරීමට වි.වි.ප්‍ර.කො එකගතාවය ඇතිව මොරටුව "යුනි කන්සල්ටන්සි” ආයතනය වෙත භාර දී ඇත. මේ වන විට මෙම පැවරුම සම්පූර්ණ කර “COPE” නිරීක්ෂණය සඳහා 2011 ජුනි මස 07 දින ඉදිරිපත් කර ඇත.

**4.4 අත්තිකාරම් නිරවුල් කිරීම**

(අ) සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් අවලංගු කිරීම හෝ කල් දැමීම හේතුවෙන් ලබා ගත් අත්තිකාරම් මුදල් වියදම් කිරීමකින් තොරව ආපසු ගෙවා දමන ලදි.

(අ) අත්තාකාරමී ගෙවීමේ දි මේවන විට නිෂ්චිත ප්‍රතිපත්ති යොදාගනු ලබයි.

**4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

විශ්වවිද්‍යාලය විසින් උපකුලපතිවරයා වෙත නිල නිවසක් ලබා දී නොමැත. ඒවාගේම උපකුලපතිවරයා වෙත කිසිඳු කුලී දීමනාවක් ද විශ්වවිද්‍යාලය විසින් උක්ත කරුණ සම්බන්ධයෙන් ලබා නොදෙයි. මෙම කරුණු දෙකම සලකා බලමින් විශ්වවිද්‍යාලය විසින් උපකුලපතිවරයාගේ පෞද්ගලික නිවසේ උපයෝගීතා බිල්පත් සඳහා ගෙවීමක් කර ඇත. මෙය විශ්වවිද්‍යාලය විසින් උපකුලපතිවරයාට රාජකාරී නිල නිවසක් ලබා දීමට වැය වන පිරිවැය සමග සසඳා බැලීමේදී විශ්වවිද්‍යාලයට වාසි සහගත තත්ත්වයක් වේ.

**4.6 භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම**

**(අ) ප්‍රසම්පාදනය කිරීම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ (ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛ අංක 08) 2.11.3 වගන්තියේ විධිවිධාන විධිමත්ව අනුගමනය කරන ලදි.

**(අ) වානේ මේස හා පුටු මිලදී ගැනීම**

ව්‍යවහාරික විද්‍යා පීඨයේ ආපන ශාලාව සඳහා ඉතා ඉක්මනින් වානේ පුටු සහ මේස අවශ්‍ය වූ අතර ඒ සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැදවුම් හතරක් ලබා ගන්නා ලදි. පෙන්වා දෙන ලද අඩුපාඩු සටහන් කරගත් අතර ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**4.7 පර්යේෂණ ප්‍රදාන**

**(අ) පර්යේෂණ දීමනා ලබා ගැනීමේ පටිපාටිය**

(1) තම පර්යේෂණ වාර්තා පිළිබඳ තොරතුරු සම්පූර්ණ කර මෙතෙක් භාර නොදුන් කාර්ය මණ්ඩලය වෙත ප්‍රමාදයකින් තොරව ඉක්මනින් භාර දෙන ලෙස දන්වා ඇත.

(2) පර්යේෂණ කමිටු රැස්වීම් දැන් ක්‍රමානුකූලව පවත්වයි.

**(අ) නිරවුල් නොකළ පර්යේෂණ ප්‍රදාන**

ඇතැම් පර්යේෂකයින් සඳහා පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව (RPC) විසින් කාල දිගුකිරීමක් ලබා දී ඇත. 2013 අප්‍රේල් මස 25 වන දින පවත්වන ලද අංක 25/2013 දරන පර්යේෂණ හා ප්‍රකාශන කමිටු රැස්වීමට අනුව පර්යේෂණ ප්‍රදාන නැවත අය කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. අපගේ ලිපි අංක එෆ්ඒ/වීසි/බි/ඒජී/2012 නැමැති ලිපිය හරහා අපගේ විස්තරාත්මක නිරීක්ෂණයන් ඔබ වෙත දන්වා ඇත. (ඔබගේ යොමු අංක - ඒඑන්/ඒඑම්/ඒ/එස්ඉයුඑස්එල්/2012/08)

**4.8 ගෙවීම්**

**(අ) ගරු දීමනා - රු. 1,111,036**

උත්පාදිත අරමුදල් වලින් භාහිරව පාලන අධිකාරියේ අනුමැතිව ඇතිව සහ කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිව සහිතව උක්ත සඳහන් ගරු දීමනා ගෙවීම් සිදු කර ඇත.

**(ආ) කුලී ගාස්තු ගෙවීම - රු. 98,800**

භාහිර විභාග ආශ්‍රිත කටයුතු සහ එම දිනයන්හි භාහිර විභාග අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරයා නිවසේ සිට කාර්යාලය වෙත රැගෙන ඒමටත් ඒවාගේම විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ භාහිර විභාග අංශයේ සිට විභාග මධ්‍යස්ථාන වෙත ප්‍රශ්න පත්‍ර සහ ලිපි ද්‍රව්‍ය රැගෙන යාම සඳහා උක්ත සඳහන් වාහනය කුලී පදනම මත යොදා ගනු ලැබීය.

කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගේ ඇතුළුවීමේ හා පිටවීමේ වාර්තා සහ අමුත්තන්ගේ වාර්තා පමණක් විශ්වවිද්‍යාලයට ඇතුළුවන ස්ථානයේ ඇති ආරක්ෂක කාර්යාලය විසින් පවත්වා ගෙන යනු ලබයි. අමුත්තන්ගේ වාර්තා තුළ නම, වාහන අංකය සහ විශ්වවිද්‍යාලයට ඇතුළුවූ වේලාව සටහන් කරනු ලබයි. අනෙක් වාර්තාවේ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගේ ඇතුළුවීමේ හා පිටවීමේ වේලාවන් පමණක් වාර්තා කරන අතර වාහනය පිළිබඳ තොරතුරු සටහන් නොකරයි එම නිසා භාහිර විභාග අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරයා විසින් කුලී පදනම මත යොදා ගන්නා ලද වාහනය පිළිබඳ තොරතුරු අමුත්තන්ගේ වාහන වාර්තා තුළ සටහන් නොකරයි.

**(ඇ) අයකර නොගත් විදුලි ගාස්තු**

නිල නිවාස වල පසුගිය කාලය තුළ පදිංචිව සිටි පුද්ගලයින්ගෙන් හිඟ බදුකුලි සහ විදුලි බිල්පත් ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

**4.9 පුස්තකාල පරිපාලනය**

නිවැරදි කර ගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. ඉදිරියේදී පොත් බැහැර දීමේ ප්‍රතිපත්තිය දැඩිව අනුගමනය කරනු ලැබේ.

**4.10 අධ්‍යක්‍ෂ හා සම්බන්ධීකාරකවරුන් පත් කිරීම**

2010 ඔක්තෝම්බර් 25 දිනැති අංක 935 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව පත් කිරීම් සම්බන්ධ අවශ්‍ය පියවර ගැනීම ආරම්භ කර තිබේ.

<u>5 ගිණුම් කටයුතුවල ස්වභාවය සහ යහ පාලනය</u>

**5.1 සංයුක්ත සැලැස්ම**

සටහන් කර ගතිමි. නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

සටහන් කර ගතිමි. 2013 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කරමින් පවතී.

**5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

සටහන් කර ගතිමි. 2013 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරමින් පවතී.

**5.4 අය වැය ලේඛනමය පාලනය**

අය වැය ලේඛනය පාලනය කිරීම සඳහා සියළුම උත්සාහයන් ගනු ලැබේ.

**5.5 වාර්ෂික වාර්තාව සභාගත කිරීම**

2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මේ වනවිටත් භාර දී ඇත.

**5.6 අභ්‍යයන්තර විගණනය**

**(අ) අභ්‍යයන්තර විගණන කාර්ය මණ්ඩලය**

සහකාර අභ්‍යයන්තර විගණකවරයෙක් සඳහා විශ්ව විද්‍යාලය තුළ පුරප්පාඩුවක් පවතින අතර දැනට අභ්‍යයන්තර විගණන අංශයේ ප්‍රධානත්වය සහකාර අභ්‍යයන්තර විගණකවරයෙක් විසින් දරයි. මෙම අංශය සඳහා විගණක සහකාරවරුන් දෙදෙනෙක් අනියුක්ත කර ඇත.

**6.0 පද්ධති හා පාලන**

(අ) සටහන් කර ගතිමි.

(ආ) වත්කම් පිළිබඳ භෞතික පරීක්ෂණයක් සිදු කරමින් පවතියි.

(ඇ) අත්තාකාරමී ගෙවීමේ දි මේවන විට නිෂ්චිත ප්‍රතිපත්ති යොදාගනු ලබයි.

(ඈ) සටහන් කර ගතිමි. නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) කථිකාචාර්යවරුන් දෙදෙනෙක් සම්පූර්ණ බැදුම්කර වටිනාකම ඔහුගේ අර්ථසාදක අරමුදලෙන් අය කර ගැනීමට කැමැත්ත පලකල ඇති අතර ඒ අනුව කටයුතු කරනු ලැබේ. අනෙක් කථිකාචාර්යවරයා ද සම්පූර්ණ අර්ථ සාදක අරමුදල බැදුම්කර වටිනාකමින් පාර්ශවික නිරවුල් කිරීමක් ලෙස හිලව් කිරීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත.

(ඊ) සටහන් කර ගතිමි. දැනට සේවයේ සිටින සේවක මණ්ඩල සාමාජිකයින් වෙත ලබා දුන් ණය ගිවිසුම් චක්‍රලේඛ උපදෙස් වලට අනුකුල වන ලෙස අය කර ගනු ලැබේ. කෙසේ වෙතත් හිටපු සේවකයින්ගෙන් අයවිය යුතු ණය ඔහුන්ගේ අර්ථ සාදක අරමුදල් මගින් ආවරණය කර ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

ආචාර්ය එස්.එම්. මොහොමඩ් ඉස්මායිල්

උප කුලපති

පිටපත් - සහකාර අභ්‍යයන්තර විගණකාධිපති